# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2315/46 - 2023 ජනවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2023.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

රනිල් වික්‍රමසිංහ,
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2023 අංක 03 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. 2022 සැප්තැම්බර් 16 දිනැති අංක 2297/79 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 15 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 4 රෙගුලාසිය සහ 2022 ඔක්තෝම්බර් 31 දිනැති අංක 2304/04 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 19 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි, එකී රෙගුලාසි යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අගතියක් නොවන පරිදි මෙයින් අවලංගු කෙරේ.


1A - PG 6189 — 376 (2023/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. 2022 ජුනි මස 24 දිනැති අංක 2285/19 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මගින් සංශෝධිත 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි වල අංක 4 (ඇ) රෙගුලාසියෙන් අවසර දී ඇති පරිදි වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත විවෘත ගිණුම්/භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කරනු ලබන තිරිඟු පිටි තොග **(එච්. එස්. සංකේතාංකය 1101.00.10)** ශ්‍රී ලංකාවේ වරාය/ගුවන්තොටුපළ වෙත පැමිණෙන දිනය 2023 ජනවාරි මස 31 දක්වා දීර්ඝ කරනු ලැබේ.

5. සංශෝධිත 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි වල **I වන උපලේඛනයෙහි 1101.00.10 එච්. එස්. සංකේතාංකය** යටතේ වර්ග කර ඇති තිරිඟු පිටි ආනයනය ද, 2023 ජනවාරි මස 31 දක්වා, සංශෝධිත, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි වල 6 වන රෙගුලාසියෙන් නිදහස් කරනු ලැබේ.

6. ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත අංක 4 දරන රෙගුලාසිය උල්ලංඝනය කරමින් සිදුකරන ඕනෑම ආනයනයක් සම්බන්ධයෙන් වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් උපදෙස් ලබා ගත යුතුය.

7. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම උදෙසා ශ්‍රී ලංකා රේගුවට සහ බලපත්‍රලාභී බැංකුවලට අවශ්‍ය "මෙහෙයුම් උපදෙස්" නිකුත් කිරීමට ආනයන හා අපනයන පාලන පාලක ජනරාල්වරයාට මෙයින් බලය පවරනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.